කවිය, ගීතය, විචාර මතවාද හා "උඩුගං බලා"

රවි සිරිවර්ධන
ravi.siriwardhana@gmail.com



උස් - නුස්
-අර ඉගැළ නහිකම-

හරිම
උස
කළු මුදුන්

වලා
හිස
වෙළාගෙන
රෝහීව

බිම
බලති
දුකින්

"නොහැකි
හැටි
කිසිවකුට
වන්නට
උඩට
ලෙඩට
දුකට
වත්
පිහිටට"

ප්‍රවීන සිනමාවේදී තිස්ස අබේසේකරයන් පසුගිය දා දැයෙන් සමුගත්තේය. අඩසියවසකට ආසන්න කාලයක් සිංහල සිනමාව හා සාහිත්‍ය පෝෂණය කිරීමෙහි ලා අද්විතීය මෙහෙවරක් කළ හේ මාතෘ භූමිය තුළ අතළොස්සක් වූ ද්විතීයික උගතුන් අතර දීප්තිමත් විද්වතෙක් විය. ගම්පෙරළිය චිත්‍රපටියේ දෙබස් රචකයා ලෙස සිය සිනමා චාරිකාව ඇරඹූ හේ දෙළොවක් අතර, නිධානය, වැලිකතර, වීදුරු ගෙවල්, කළුදිය දහර, අහසින් පොළොවට, පුරන් අප්පු, ගඟ අද්දර, සක්මන් මළුව වැනි චිත්‍රපටයන්හිද දෙබස් රචකයා බවට පත්වෙමින් ද කරුමක්කාරයෝ විරාගය මහගෙදර වැනි අපූර්ව සිනමා කෘතීන්හි අධ්‍යක්ෂකවරයා වෙමින් ද සිංහල සිනමා වංශ කතාවේ කැපී පෙනෙන භූමිකාවක් නිරූපනය කළේය. එමෙන්ම විටෙක නළුවකු, සිනමා හා සාහිත්‍ය විචාරකයකු ලෙස මතු නොව වාමාංශික දේශපාලනයේ පෙරටුගාමී බල කණ්ඩායක් ලෙසද ඔහුගේ කාර්යභාරය කැපී පෙනුණි.

තිස්ස අබේසේකරයන් කවිය හා ගීතය පිළිබඳ මෑතකදී පළකළ අදහසක් මෙවර විදර්ශන තුළින් ශාස්ත්‍රීය විමසුමට ලක්වන අතර එය මා විසින් සම්පාදනය කරන ලද්දේ ඔහුගේ හදිසි අභාවයට පෙර බව අප පාඨකයන් සළකුව මනාය. එය කිසිදු වෙනසක් නොකොට පළ කිරීම අප සිනමාවේදියාට කරනු ලබන අගෞරවයක් නොවන බව මම කල්පනා කරමි. මන්ද ඔහු සැමවිටම බුද්ධිමය සංවාදය ප්‍රිය කළ විද්වතකු බැවිනි.

අපි ඒ අපූර්ව සිනමා වේදියාට සොඳුරු මානව හිතවාදියාට නිවන් සුව පතමු.

කවිය ගීතය විචාර මතවාද පිළිබඳව මෙල්බන් නුවර වෙසෙන ඇතැම් ශ්‍රී ලාංකික සහෘදයන් අතර පවතින දුරවබෝදය දුරුකරනු වස් දැනුවත් සහෘදයන් කිහිපදෙනෙකු විසින් කරන ලද ඇරයුම මෙම ලිපියට නිමිත්ත බව පළමුව කිව යුතුව තිබේ. අදාළ විෂය පිළිබඳව පවතින මෙම වියවුල පසුගිය මස හතර වැනිදා පැවති "උඩුගං බලා" සහෘද සංවාද මණ්ඩපය තුළදී අප හමුවේ නිරාවරණය විය. ඒ පිළිබඳ අප පුදුමයට හෝ උදහසට පත් නොවෙමු. මන්ද අදාලු විෂය ක්ෂේත්‍රය තුළ සැරිසරන ඇතැම් විද්වතුන් පවා යල් පිනු මත "දේවභාෂිත" සේ ගෙනහර පාන වටපිටාවක සහෘද සමාජයේ වියවුලු පිළිබඳ කියනුම කවරේද !

2002 වසරේ දී මා සමුදු වෙත්තසිංහ සමග එක්ව සංස්කරණය කොට එළිදක්වන්නට යෙදුනු පිටු 332 කින් යුතු "ශ්‍රී ලාංකික සංගීතයේ රෝහණ ලකුණ" කෘතිය වෙනුවෙන් සිනමාවේදී තිස්ස අබේසේකර හා මහාචාර්ය කාලෝ ගොන්සේකා යන විද්වතුන් අපගේ ආරාධිත ලේඛක පිරිස අතරට එක්කර ගත්තෙමු. උක්ත කලාකරුවන් අඳ හක්තියෙන් වැඳ නමස්කාර කරනු වෙනුවට ඔවුන් සතු ශබ්දතා දැන ඒවා උක්ත ශාස්ත්‍රීය කෘතිය තුළින් පාඨක සමාජයට දායාද කිරීමට අපට හැකිවිය. බුද්ධිමත් සාහිත්‍ය සමාජයට වැදගත් වන්නේ එයයි. මෙල්බන් නුවර කවුදෝ "වැඩබැර්ටාසන්" කෙනෙකු පුවත්පත් පිටුවක මළපත කොට "වන්දනයෙන් " හා පිට "කැසීමෙන්" සිය නිවට රුචිකත්වය සන්තර්පනය කරගත්තද සැබෑ සහෘදයා සතුටට පත්වන්නේ ගැඹුරු වින්දනයෙනි. එම අපූර්ව වින්දනය ලබාදෙනුවස් "වන්දනය" තුරන් කොට "සැබෑ වින්දනයට" මඟ පාදා ගත යුතුය. එය කළ හැක්කේ දැනුම ගුහුබඳ යන නිවහල් සාහිත්‍යප්‍රේමීන්ට පමණි.

තිස්ස අබේසේකර යනු සුවිශේෂ කුසලතාවක් ප්‍රකට කළ සිනමාවේදීයෙකි. ඒ පිළිබඳ අප අතර විවාදයක් තිබිය නොහැකිය. එහෙත් එම කුසලතාවයේ නාමයෙන් ඔහු විචාර මත සේ එළියට දමන සියල්ල වැළඳ ගැනීමට දැනුවත් රසිකයෝ සූදානම් නොවෙති. විෂයගත කරුණු පිළිබඳ සිය අදහස් පලකිරීමේදී ඔවුහු වඩාත් සැලකිලිමත් විය යුත්තේ එබැවිනි.

තිස්ස අබේසේකරයන් "උඩු ගං බලා" කළ එළි දැක්වීමේදී ගීතය හා කවිය පිළිබඳ කරන ලද යල් පිනු මතවාද හමුවේ අප සසල විය. කවිය හා ගීතය අද වඩාත් ළං වූ සබැඳියාවකින් යුතු කලා මාධ්‍යන් දෙකක් බවට ඔහු කළ ප්‍රකාශය කිසිසු ශාස්ත්‍රීය පදනමකින් තොරව කරන ලද්දකි. එය කවියේත් ගීතයේත් නව ප්‍රවණතා පිළිබඳ ඔහු සතු අනවබෝධය ප්‍රදර්ශනය කිරීමක් වූ අතර එම ප්‍රකාශය තහවුරු කරනු වස් කිසිදු ගවේශනාත්මක කරුණක් ඔහු වෙතින් ඉදිරිපත් නොවුණි. දැනුවත් දේශකයින් අතින් සිදුවිය යුත්තේ ගවේශනාත්මක කරුණු තුළින් සහෘද විශ්වසනීයත්වය තම මතය කෙරෙහි දිනාගැනීම මිස යල් පිනූ මතවාද සමාජගත කිරීම නොවේ.

තිස්ස අබේසේකරයන්ට අනුව කවිය හා ගීතය එකිනෙකට ළංවී ඇද්ද ? සැබැවින්ම නැත. කවිය පෙරටත් වඩා ගීතයෙන් දුරස් වී තිබේ. මන්ද අතීතයේ කවිය හා බැඳී ශ්‍රව්‍යගෝචර ලක්ෂණ පවා අද එතුළින් බොහෝ ලෙස දුරස්ථ වෙමින් පවතින බැවිනි. ඒ වෙනුවට කවිය ප්‍රබල දෘෂ්ටිගෝචර ආකෘතියකින් සැරසී වඩා බුද්ධිමය දාර්ශනික අරුත් ප්‍රකාශ කෙරෙන දිශාවකට විතැන් වී තිබේ. ප්‍රකට නූතනවාදී අමේරිකානු විචාරක ටී. එච්. හැල්මි (T.H. Hulme) සඳහන් කරන ආකාරයට සැබෑ කවිය ලෞකිකත්වයෙහි අඳුර සමතික්‍රමණයටකොට දුරදර්ශක ගුණයෙන් (VISIONARY QUALITY) යුක්ත වෙයි. එනම් ඉන්ද්‍රිය සංජානනය ඉක්මවා වඩාත් පෘතුල දාර්ශනික අරුත් කූලගන්වනු ලබයි. මේ අනුව කවියේ නව්‍ය මිනුණුවර වූ කලි ගේය පද රචනයක අනිවාර්යය වූ ශ්‍රව්‍යගෝචර අරුත් හා රිද්ම ඉක්මවූවකි. එබඳු කවියක ඇති දෘෂ්‍යරූපී ලක්ෂණ එය නැවත නැවත කියවා එහි ගැඹුරට කිඳා බහින්නට සහෘදයන්ට ඇරයුම් කරයි. චිත්තරූපවාදී (IMAGIST) කාව්‍ය රීතිය ලෙසද මෙය හඳුන්වනු ලැබේ.

ගේය පද රචනයකදී එහි ශ්‍රව්‍ය ගෝචර බව කේන්ද්‍රීය සාධකයක් වෙයි. සජීව ඇසෙන ගීතයෙහි අරුත් රසිකයා වහා වින්දනයට පත්කල යුතුය. ඉන් ගම්‍ය වන්නේ ගීතය තුළ කාව්‍යමය ගැඹුරක් නොමැති බව නොවේ. ගේය පද රචනයේදී එම කාව්‍යමය ලක්ෂණ එහි මාධ්‍යයික සීමා මායිම් හමුවේ ඊට උචිත හැඩයකට ඉදිරිපත් කිරීමට රචකයාට සිදුවේ. එබැවින් කවියාට හිමි පූර්ණ ආකෘතිමය නිදහසත් භාෂාධිකරණයත් ගීත රචකයාට හිමි නොවේ. එය බහු කර්තෘක කලා මාධ්‍යක් වන බැවින් ඔහු සංගීතඥයා හමුවේ සිය පද මාලාවේ හැඩතල "මෙල්ල කරගත" යුතුය. සැබැවින්ම පරිපූර්ණ ගීතයක් යනු සාහිත්‍යත්, සංගීතයත් මිනිස් කටහඬත් අර්ථමූලිකව සුසංයෝග වන අවස්ථාවකි. මෙම සංයෝගය එකිනෙකට නොදෙවෙනි ලෙස ඉදිරිපත් වූ කල්හි සාර්ථක ගීතයක උපත සිදුවේ.

කවිය, සපුරා කවියාගේ කේවල පරිකල්පන ලෝකයම ගෙන හැර පෑමක් වෙයි.ගීත පද රචනයත් කවියත් අතර පැවති පැරණි නෑ සබඳකම අද වන විට බෙහෙවින් දුරස්ථ කරණයකට ලක්ව ඇති බව නූතන කවිය පිළිබඳ ශාස්ත්‍රීය විසඳුමකදී පැහැදිලි කරගත හැකිය. කිවිවර මහගමසේකරයන් කවිලෙස ලියූ ඇතැම් රචනා විශාරද අමරදේවයන් එකලූ ගීත ලෙස ගායනා කළ ද නූතන කවි එළෙස ගීත සේ ගායා එහි අරුත් මතුකරගත නොහැකිය. මන්ද නව කවියෙහි පද බෙදීමේ සිට කොමාවක්, නැවතීමේ තිතක් දක්වා වූ මුළු මහත් කාව්‍ය ශරීරයම දෘෂ්‍යමය හැඩතල අනුව අරුත්ගන්වා ඇති බැවිනි. එයට නිදසුන් ලෙස මම එවන් එක් කවියක් ඔබ වෙත ඉදිරිපත් කරමි. මෙය කිවිවර ආරියවංශ රණවීරයන්ගේ "අතු ඉති" කාව්‍ය සංග්‍රහයෙන් උපුටාගත් කවියකි. මෙහි ඇති චිත්තරූපවාදී ගුණයත් ප්‍රබල පරිකල්පනයත් මාධ්‍රීය පූර්ණ සාහිතමය ප්‍රකාශනයක් තුළ ගීතවත් කළ නොහැකිය.

හරිම
උස
කළු මුදුන්

වලා
හිස
වෙළාගෙන
රෝහීව

බිම
බලති
දුකින්

"නොහැකි
හැටි
කිසිවකුට
වන්නට
උඩට
ලෙඩට
දුකට
වත්
පිහිටට"

නූතන බටහිර කවිය දෙස බැලූවත් චූවන් - චු (chuen - chu) නැමැති චීන කාව්‍ය මාර්ගයට අනුගත ජපන් හයිකු කවිය දෙස බැලූවත් අපට හමුවන්නේ කුඩා කාව්‍ය ශරීරයක් තුළ මහා අරුතක් කැටි කළ කාව්‍ය වාපාරයකි. ශ්‍රී ලාංකික කවීන්ද නූතන ජගත් කවියේ ආභාසය ලබමින් පෙර නොවූ විරූ සාර්තකත්වයක් වෙත විතැන්වන අයුරු දැකගත හැකිය. ආරියවංශ රණවීර, නන්දන වීරසිංහ, එච්ක් ඉලයප්පාරච්චි වැනි නූතන කවීන් මෙම නව කාව්‍ය ප්‍රනරුදයේ පෙරගමන්කරුවන් වෙයි. ඔවුන් ගෙවී ගිය වසර 15ක පමණ කාලය තුළ නිකුත් කරන ලද කාව්‍ය කෘති පරිශීලනය කරන සහෘදයනට ශ්‍රී ලාංකික කවියේ නව දිශානතිය පිළිබඳ සැළකිය යුතු අවභෝදයක් ලබාගත හැකිවනු ඇත. එය අදු නූතන ගීතයට වඩා දුරස්ථ වූ ද සපුරා ගැඹුරු වූ ද මාර්ගයකට එළුඹ තිබේ. අප සහෘදයනට එම කවි රසවිඳිනු වස් ඉතා දියුණු රසිකත්වයක් වර්ධනය කරගත යුතු වෙයි. එම කවි නොවිඳ නිසි විචාරාත්මක එළැඹුමකට පිවිසිය හැකි නොවේ. තිස්ස අබේසේකරයන්ගේ ප්‍රකාශය යල් පැන ගිය එකක් බව අප සඳහන් කරනුයේ එම නූතන එළැඹුමට පසුපසින් ඔහුගේ මතය ගමන් කරන බැවිනි. එහෙත් ඔහුට අද්‍යතන චිත්‍රපට ක්ෂේත්‍රය පිළිබඳ මෙයට වඩා නූතන වූ මතවාදයක් තිබිය හැකිය. මන්ද, ඔහු එම විෂය තුළ වැඩි ලේ නෑ කමකින් සැරිසරන බැවිනි.

කාලෝ ගොන්සේකා යනු වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි. ඔහුගේ එම වෘත්තීය ජීවිතයට අදාල කුසලතා දන්නෝ වෛද්‍ය ශිෂ්‍යයෝම වෙත්. කලාවට ඔහුගේ ඇති ප්‍රේමය ඔහු වෙත අමතර ප්‍රසිද්ධියක් අත්කර දී තිබේ. ගීත රචකයකු ලෙසද ඔහු රචනා කොට ඇති ගීත කිහිපය තුළ අප ප්‍රිය කරන ගීත තිබෙන බව කිව යුතුය. එහෙත් ශ්‍රී ලාංකික ගීත රචක නාමාවලියේ ඔහු සුවිශේෂ ප්‍රතිභාවක් විශද කළ ගීත රචකයකු ලෙස විචාරක පැසසුමට පාත්‍ර වී නැත. එමෙන්ම ඔහු සාහිත්‍ය පිළිබඳ ගැඹුරු ඥානයකින් පොහොසත් වුවතුදු නොවේ. වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඔහු සතු කුසලතාව ඊට පරිබාහිර විෂයන් පිළිබඳ අශාස්ත්‍රීය ප්‍රකාශ කරන්නට ලබාදෙන වලංගු පත්‍රයක් නොවන්නේ එබැවිනි. ඔහුට කලාව පිළිබඳ මහත් වූ අභිරුචියක් හා ගෞරවයක් තිබෙන බව අපි දකිමු. ඒ පිළිබඳව අප සතුටට පත්විය යුතුය. එහෙත් නිසි හැදෑරීමකින් පරිබාහිරව ඔහු අප සහෘදයා හමුවේ ගෙනහැර පාන මතවාද ඔවුන් නොමඟ යවන සුළුය. විචාරකයකු යනු සෑම විටම සාමාන්‍ය රසිකයාට වඩා සිය විෂය තුළ අඛණ්ඩ අධ්‍යයනයක හා අළුත්වීමක (update) සිටින්නකි. ඔහු ඉදිරිපත් කරන මතවාද සෑම විටම රසිකයින්ගේ දැනුම පොහොණි කරනු වස් තීරණාත්මක මෙහෙයක් ඉටු කරන්නේ එබැවිනි. නිර්මාණයක් රසවිඳීමේදී ද විචාරකයකුගේ මගපෙන්වීම රසිකයාට බෙහෙවින් වැදගත් වෙයි. මේ අනුව බලන කල විචාරයේ නාමයෙන් ඉදිරිපත් කරනු ලබන අවිචාරවත් මතවාද සාහිත්‍ය සමාජයේ ප්‍රගමනයට හේතු නොවේ. මන්ද ඇතැම් ප්‍රකට චරිත විසින් ඉදිරිපත් කරනු ලබන අශාස්ත්‍රීය මත සමාජය තුළ "දේවභාෂිත" වීමට ඉඩ තිබෙන බැවිනි. මේ දිනවල අප මහාචාර්යතුමා "දේශපාලන විහිලු" සපයමින් කල්ගත කරන බව පුවත්පත් බලන අප හිතවතුනට අලුත් කරුණක් නොවේ. එම විහිළු දේශපාලනයේ නියුතු පුද්ගලයන් පවා අපේක්ෂා නොකරන තරමේ පහළ අඩියකට වැටී තිබීම කණගාටුවට කරුණකි. ඔහු "උඩුගං බලා" ගීත සමුළුවේ එන "ප්‍රේමය නම්" යන ගීතයේ පද රචනය පමණක් එහි රචකයා අමරණීයත්වයට පත්වීමට ප්‍රමාණවත් යැයි කළ ප්‍රකාශය සුභාවිත සිංහල ගීතයේ දිග පළල දත් රචකයෝ විමතියට පත් කරන්නකි. එමගින් දැනුවත් සහෘදයන්ගේ බුද්ධියට හිනා දීමක් සිදු කරන මහාචාර්යවරයා එම ආධුනික ගීත රචකයා සපුරා නොමග යැවීමක් සිදුකොට තිබේ. එම ගීත පිළිබඳ වූ සංවාද මණ්ඩපයට පැමිණීමට පළමුව එම හී කිහිපවරක් ශ්‍රවණය කළ අපට එම ප්‍රකාශයේ බරපතල බව හොඳින් අවබෝධ විය.

සැබවින්ම "උඩුගං බලා" යනු ඉතා ආධුනික ගීත සරණියකි. තිස්ස අබේසේකරයන්ද එහි එන එකම ගීතයක් පිළිබඳව හෝ සුවිශේෂ සඳහන් කිරීමක් නොකිරීමට වගබලාගෙන තිබීමෙන් ඔහු ඔහුගේ රසිකත්වය නේරාගෙන ඇතැයි මම සිතමි. මහාචාර්ය සරත් විජේසූරිය යනු මා සරසවි සිසුවෙකුව සිටි අවධියේ අපට සාහිත්‍ය විචාරය ඉගැන්වූ එක් ආචාර්යවරයෙකි. ඔහු එවකට තිබූ ඉතා නූතන සාහිත්‍ය කෘති වෙත අපගේ විචාරක්ෂිය යොමුකොට අප දැනුම පෝෂණය කළ බව මෙහිදී කෘතවේදීව සඳහන් කළ යුතුය. "උඩුගං බලා" කල එළි මංගල්‍යයේදී වඩාත් සාර්ථක දෙසුමක් කළහැකිව තිබූ විද්වතා ලෙස මා සලකන්නේ ඔහුය. එහෙත් ඔහුගේ කතාව පිළිගැනීමේ කතාවට පමනක් ලඝු විය.

"උඩුගං බලා" ඉතා ආධුනික ගීත රචකයෙකුගෙ වෑයමක් වුවද ඔහුගේ සම්ප්‍රාප්තිය අපගේ සොම්නසට හේතුවෙයි. කනගාටුව ඇත්තේ අප රචකයා තම නිර්මාණ පිළිබඳ සිතා අතරමං වී සිටින "උරෝපියාව" පිළිබඳවයි. ඔහු සිතන ආකාරයේ කිසිදු අර්ථපූර්ණ අත්හදා බැලීමක් එහි අපට හමු නොවේ. තවමත් එම ගීත පවතිනුයේ භාෂාවත්, අනුභූතියත්, පරිකල්පනයත් අතර නොවිසඳන අවුලක බව මගේ හැඟීමයි. එය විසඳගනු වස් අප රචකයා තව තවත්